# උපකාර ගිරා පැංචා



ඩබ්. එම්. විනුලි කවිංසා විජේසූරිය

# දඟකාර ගිරා පැංචා

ඩබ්.එම්. විනුලි කවිංසා විජේසූරිය

ප්‍රථම මුද්‍රණය : 2023

කර්තෘ : ඩබ්.එම්. විනුලි කව්ංසා විජේසූරිය

ලිපිනය : නො: 81, ජයලත් නිවස,
පල්ලේඇළුදෙණිය,
ගෙලිඔය

ISBN අංකය : 978-624-208-031-4

මුද්‍රණය
"PRESS"
නො: 24, කොටුගොඩැල්ල වීදිය,
මහනුවර.

# පිදුම

ලොව සිටිනා සියලුම සතුන්ට සහ පරිසරයට ආදරය කිරීමට

මා හට හුරුගැන් වූ මාගේ පියාණන් හා මෑණියන්ටද,

පොතක අගය කියාදෙමින් පොත් කියවීම හා ලිවීමට

සෑම දෙනාටම හුරු කරවන්නට දැඩි උත්සහයක් දරණ

මාගේ ආදරණීය ගුරු මෑණියන් වන

සමන්මලී ගුරු මෑණියන්ටත්

මෙම පොත ඉතා ආදරයෙන් පුද කරමි...

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් අපේක්ෂා කරනුයේ ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් දිවිය දිනන ''විද්‍යුත් පොතක්'' ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ ''දිවිය දිනන විද්‍යුත් පොතක්''ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.


මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක් වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය, ගුරු භවතුන්, දෙමාපියන් ආදි ශිෂ්‍යාවන්, සෙසු පාසල්වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023-01-01


# ස්තූතිය

පොත ලිවීමට මා හට උදව් උපකාර කළ හා මා දිරිගැන් වූ දෙමාපියන්, ගුරු මණ්ඩලය හා සහෝදරියන් ඇතුළු උපකාර කළ සියලු දෙනාටම ස්තූතිය පුද කරමි.

එකමත් එක කාලෙක ගිරා පවුලක් සිටියා. ඒ පවුලේ ගිරා පැටියෙක් සිටියා. එයා හරිම දඟයි. දවසක් එයාගේ පවුලේ අම්මයි, තාත්තයි කෑම හොයන්න ගියා.



හැබැයි ගිරා පැංචාට අම්මයි, තාත්තයි කියලා ගියේ එළියට එන්න එපා කියලා.



ඒත් ගිරා පැංචා ඒක ඇහුවේ නැහැ. එයා එළියට ආවා. ඊට පස්සේ ගිරා පැංචා සර්පයෙක් දැකලා හොඳටම බය වුණා.




ගිරා පැංචා හොඳටම වෙව්ලන්න ගත්තා. ඊට පස්සේ බයට ගිරා පැංචා පියාඹන්න හැදුවා.



ඒත් එයාට තවම පියාඹන්න බැහැ. එයා එකපාරම බිම වැටුණා.



වැටුණාට පස්සේ එයාට හොඳටම රිදුණා.



එයා හොඳටම ඇඬුවා. ටිකක් වෙලා යද්දි එයාගේ අම්මයි, තාත්තයි ආවා.



ඒත් අම්මයි, තාත්තයි ගිරා පැංචාව දැක්කේ නැහැ. ගිරා පැංචා අම්මවයි, තාත්තවයි දැක්කෙත් නැහැ. ගිරා අම්මයි, තාත්තයි හොඳටම බය වෙලා ගිරා පැංචාව හෙව්වා.



හොයන විට ගිරා පැංචා බයවෙලා අඬනවා තාත්තා දැක්කා. ගිරා පැංචා හොඳටම අඬනවා. එයාට පියාඹන්න බැහැ. තාත්තයි, අම්මයි එයා ළඟට පියාඹලා ආවා. අම්මයි, තාත්තයි දැකපු එයාට හරි සතුටුයි. එයා අම්මටයි, තාත්තටයි පොරොන්දු වුණා ආයේ කවදාවත් දඟ වැඩ කරන්නේ නෑ කියලා. ඊට පස්සේ එයා හොඳ පැටියෙක් වුණා.



ටික කාලයකට පස්සේ ගිරා පැංචාට පියාඹන්න පුළුවන් වුණා. ගිරා පැංචා අම්මයි තාත්තයි එක්ක සතුටින් පියෑඹුවා.





## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොතපතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේදී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිව යුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කුරු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක
2023-11-01